ගිණුම් පිළිබඳ විගණන මතය ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබිණි..කොන්ත්‍රාත් ලේඛනය මිනුම් ලේඛනය ඇස්තමේන්තු ලෙජරය යාවත්කාලීන කර පවත්වත්වා ගෙන නොයෑම. වැටුප් ලේඛනය තුලනය කර සැසඳුම් ප්‍රකාශ පිලියෙල නොකිරීම. මෘදුකාංගයට අදාළ මුර පද වෙනස් නොකිම,සංයුත සැළැස්මට අනුව ප්‍රසම්පාදන සැළැස්ම සකස් නොකිරීම, වාර්ෂික ක්‍රියකාරි සැලැස්ම සකස් කර නොතිබීම.විගණන හා කළමණාකරන කමිටු නොපැවැත්වීම.හාණ්ඩ සමීක්ෂණ වාර්තා නියමිත දිනට විගණකාධිපතිට ඉදිරිපත් නොකිරීම.සියළු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු නොකිරීම.හිගහිටි අදායම් අය නොකිරීම. සභාව සතු දේපල සඳහා දීර්ඝ කාලීන බදු කුලී අය කර නොතිබීම. තොරතුරු නිළධාරි පිළිබඳ දත්ත හා ප්‍රගාමී තොරතුරු මහජනතාවට ප්‍රදර්ශනය නොකිරීම.ජනතා පැමිණිලි ලේඛනගත කිරීම, ගත් ක්‍රියාමාර්ග පැහැදිලි කරන	<u>ගිණුම් පිළිබඳ විගණන මතය</u> මේ සඳහා 2023 වර්ෂයේ ලැබී ඇති මතය තත්වාගනනය කළ මතය වේ. මෙම ගිණුම් සකස් කරන ලද්දේ නවක නිළධාරියෙකු විසිනි. ගිණුම් සකස් කිරීමේදී දෛනික, වාර්ෂික,ගිණුම් තුලනය කරමින් අවසාන ගිනුම් සකස් කරයි. වර්ෂ අවසානයේදී ගිණුම් තුලනය කිරීමේදී දෝෂ පැවතීම, වත්කම් හඳුනා නොගැනීම හා ආදායම් අයකර නොගැනීම හේතු වී තිබුණි. ඉහත සඳහන් මතයට වඩා හොඳ මතයක් ගැනීමට නිවැරදි ගිනුම්කරණය තුලින් ගිණුම් සකස් කිරීමට කටයුතු කරමි. <u>ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබීම</u> ස්ථාවර වත්කම් ලේඛනය යාවත් කාලීන කර පවත්වා ගෙන යාමට කටයුතු කර ඇත. මේ සඳහා මහ සභාවේදී වත්කම් සමීක්ෂණ මණ්ඩලයක් පත් කිරීමට කටයුතු කර ඇති අතර මේ වසර අවසන් වන විට වත්කම් සමීක්ෂණ කටයුතු සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. <u>කොන්ත්‍රාත් ලේඛනය මිනුම් ලේඛනය ඇස්තමේන්තු ලෙජරය යාවත්කාලීන කර පවත්වත්වා ගෙන නොයෑම</u> කොන්ත්‍රාත් ලේඛනය (කර්මාන්ත ලේඛනය) - මෙම කර්මාන්ත ලේඛනය යාවත් කාලීන කර නොතිබූ අතර , 2026 වර්ෂයේ සිට යාවත්කාලීනව පවත්වාගෙන යනු ලැබේ. මෙම ප්‍රාදේශීය සභාව මිණුම් පොතක් පවත්වාගෙන ගොස් නොතිබූ අතර, 2026 ජුනි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සකස් කරන ලෙස කාර්මික නිලධාරී මහත්මීන්ට උපදෙස් ලබා දුන් බව කාරුණිකව දන්වා සිටිමි. <u>වැටුප් ලේඛනය තුලනය කර සැසඳුම් ප්‍රකාශ පිලියෙල නොකිරීම. මෘදුකාංගයට අදාළ මුර පද වෙනස් නොකිරීම,</u> වැටුප් ලේඛනය තුලනය කරන අතර 2026 වර්ෂයේ සිට වාර්ෂිකව තුලනය කරන බව දන්වා සිටිමි. වැටුප් ලේඛනයට අදාළව මුරපද මාරු කිරීම මස 03ට වරක් වෙනස් කරන බව දැනුම් දෙමි. <u>සංයුත සැළැස්මට අනුව ප්‍රසම්පාදන සැළැස්ම සකස් නොකිරීම, වාර්ෂික ක්‍රියකාරි සැලැස්ම සකස් කර නොතිබීම</u> 2026 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කර ඇත. <u>විගණන හා කළමණාකරන කමිටු නොපැවැත්වීම</u> 2026 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන වැඩසටහන් පිළියෙල කිරීමට කටයුතු කරමි. <u>හාණ්ඩ සමීක්ෂණ වාර්තා නියමිත දිනට විගණකාධිපතිට ඉදිරිපත් නොකිරීම</u> 2025012.31 දිනට සිදු කළ යුතු හෘණ්ඩ සමීක්ෂණය 2026.02.26 දින අවසන් කර ඇත ඉදිරි කටයුතු සිදු කර 2026.08.31 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. <u>සියළු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු නොකිරීම</u> සභාව සතු සියළුම වාහන වල රාජ්‍ය ලාංඡනය මේ වන පින්තාරු කර ඇත <u>හිගහිටි අදායම් අය නොකිරීම</u> මේ වන විට 2025.12.31 වන විට පැවති හිග ආදායම් ආදායම් වලින් 50% ක ප්‍රමාණයක් 2026 මැයි මස 31 වන දින වන විට අය කර ඇති

ලේඛන පවත්වාගෙන නොයෑම.ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය රැස්කිරීමට වැඩපිලිවෙලක් නොතිබීම.වරිපනම් අය නොකිරීම, පොලිතින් හා ප්ලාස්ටික් ප්‍රතිශක්තිකරණයට යොමුකිරීමේ වැඩ පිළිවෙලක් නොතිබීම.මානව සම්පත් සැළැස්මක් නොතිබීම.මානව සැළැස්ම මගින් අවම පැය 12ක පුහුණුවක් කාර්ය මණ්ඩලයට ලබා නොදීම.අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ල බදවා ගැනීම.	අතර අය කිරීමට නොහැකි නිග අදායම් මු.රේ. අනුව කපා හැරීම සඳහා ගරු ආණ්ඩුකාර තුමාගේ අනුමැතියට ඉදිරිපත් කර කපා හැරීමටත්, අනෙකුත් ආදායම් අය කර ගැනීමටත් කටයුතු කරමි. <u>සභාව සතු දේපල සඳහා දීර්ඝ කාලීන බදු කුලී අය කර නොතිබීම.</u> සභාව සතු දේපල දීර්ඝ කාලීනව බදු දී නොතිබූ අතර මෙම වර්ෂයේ සිට දීර්ඝකාලීනව බදු දීම සඳහා ගරු ආණ්ඩුකාර තුමාගේ අනුමැතිය ලැබී ඇත.ඒ අනුව සභාව සතු දේපල දීර්ඝකාලීනව බදු දී කුලී අය කර ගැනීමට කටයුතු කරමි. <u>තොරතුරු නිළධාරි පිළිබද දත්ත හා ප්‍රගාමී තොරතුරු මහජනතාවට ප්‍රදර්ශනය නොකිරීම</u> තොරතුරු නිළධාරි පිළිබද දත්ත හා ප්‍රගාමී තොරතුරු මහජනතාවට දැක ගැනීම සඳහා ප්‍රදර්ශණය කර ඇත. <u>ජනතා පැමිණිලි ලේඛනගත කිරීම, ගත් ක්‍රියාමාර්ග පැහැදිලි කරන ලේඛන පවත්වාගෙන නොයෑම.</u> පැමිණිලි ලේඛනගත කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොමැති අතර ඉදිරියේදී මේ පිලිබඳ අවධානය යොමු කිරීමට කටයුතු කරමි. <u>ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය රැස්කිරීමට වැඩපිලිවෙලක් නොතිබීම, පොලිතින් හා ප්ලාස්ටික් ප්‍රතිශක්තිකරණයට යොමුකිරීමේ වැඩ පිළිවෙලක් නොතිබීම.</u> ප්ලාස්ටික් හා පොලිතීන් ප්‍රතිශක්තීකරණය කිරීමට කටයුතු කර ඇත. මේ වන විට ඝණ අපද්‍රව්‍ය කළමනාකරන මද්‍යස්ථානය පවත්වා ගෙන යනු ලබන්නේ නාගරික බල ප්‍රදේශයක පර්චස් 40 ක කුඩා ඉඩමක වන අතර, එයින් 75% ක ප්‍රමානයක කසල එකතු කරන ලබන ගොඩනැගිල්ල ඉදි කර ඇත.නොදිරන ද්‍රව්‍ය එකතු කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩ නොතිබීම හේතුවෙන් ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතු කල නොහැකි අතර, දැනට වීදුරු බොත්ල් මිලට ගෙන විකිණීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. එබැවින් ජනාකීර්ණ නොවන ස්ථානයක ඉඩමක් හදුනා ගැනීම සඳහා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත යෝජනාවක් ඉදිරිපත් කර ඇති අතර, එය ලැබුන වහාම නොදිරණ අපද්‍රව්‍ය ගබඩා කිරීමේ මධ්‍යස්ථානයක් හා ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට කටයුතු කරමි. <u>වරිපනම් අය නොකිරීම</u> මෙම සභාව විසින් වරිපනම් කලාප වලින් ආදායම් එකතු කිරීම සඳහා ගැසට් කර නොමැති අතර, ලූනුවත්ත, රතඹ අඹගස්දෝව කලාප හඳුනා ගෙන ඉදිරියේදී ගැසට්කිරීමට නියමිත වේ. එබැවින් දැනට වයාපාරික් ස්ථාන වලින් හා ආයතන වලින් රැස් කරන අපද්‍රව්‍ය සඳහා ගාස්තු අය කිරීමට හැකියාවතක් නොමැත. <u>මානව සැළැස්ම මගින් අවම පැය 12ක පුහුණුවක් කාර්ය මණ්ඩලයට ලබා නොදීම</u> 2026 වර්ෂයේ මානව සම්පත් සැලැස්මක් සකස් කර ඇති අතර 2026 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන සලසා ඇත. මේ වන විට ආයතනයේ සියලුම කාර්ය මන්ඩලය සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහනක් පවත්වා ඇත.ඉදිරියේදී කාර්ය මන්ඩලය සඳහා මෙවැනි පුහුනු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කරමි. <u>අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ල බදවා ගැනීම.</u> සේවා අවශයතාවය අනුව පලිකත් පාලන කොමසාරිස්තුමාගේ අනුමතකියට යටත්ව සේවකයින් බදවා ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 492

ආයතනයේ නම - හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාව

කමිටුව විසින් හඳුනාගත් දුර්වලතා	දුර්වලතා සඳහා ගත් ක්‍රියාමාර්ග
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය	තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කර නොතිබුණි	ස්ථාවර වත්කම් ලේඛණය මේ වන විට සකස් කර ඇත.
ඉඩම් කට්ටිකර විකිණීමේ බදු ලේඛණය යාවත්කාලිනව පවත්වාගෙන නොතිබුණි	ඉඩම් කට්ටි කර විකිණීමේ බදු ලේඛණය මේ වන විට සකස් කර ඇත.
අනුකූලතා සහතික ලබාදීමේ ලේඛණය යාවත්කාලිනව පවත්වා නොතිබුණි	අනුකූලතා සහතික ලේඛණයක් මේ වන තඩත්තු කරමින් පවති.
ඇස්තමේන්තු ලේජරය නිසි පරිදි යාවත්කාලිනව පවත්වා නොතිබුණි	ඇස්මේන්තුලෙජරය සකස් කර ඇත.
ගල් හා බොරළු ලේඛණය නිසි පරිදි යාවත්කාලිනව පවත්වාගෙන නොතිබුණි	ඉදිරියේදී මෙම ලේඛණය පවත්වාගෙන යාමට කටයුතු කරමි.
මෘදුකාංගයට අදාල මුරපද මස 03 කට වරක් වෙනස් කර නොතිබුණි.	මෘදුකාංගයට අදාල මුරපද මස 03 කට වරක් මේ වන විට කර ඇත.
සංයුක්ත සැලැස්මට අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිලියල කර සභා සම්මත කර නොතිබුණි.	ඉදිරියේදී මේ සම්බන්ධයෙන් කටයුතු කිරිමට අපේක්ෂා කරමි.
සංයුක්ත සැලැස්මට අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියල කර නොතිබුණි.	සකස් කර ඇත.
සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රසම්පාදන සැලැස්මක් නියමිත දිනයට අනුමත කර නොතිබුණි.	සභා සම්මත කර අනුමත කර ඇත.
මු;රෙ:ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	ඉදිරියේදී අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපතිට යොමු කිරිමට කටයුතු කරමි.
විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩ සටහන වර්ෂය ආරම්භයේදි පිළියල කර නොතිබුණි.	ඉදිරි වර්ෂයේදි මෙම වැඩ සටහන ක්‍රියාත්මක කිරිමට කටයුතු කරමි.
විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර් 04 ක්වත් පවත්වා නොතිබුණි.	විගණන කළමණාකරණ කමිටු 03 ක් පවත්වා ඇති අතර ඉදිරියේදී කමිටු වාර ගණන වැඩි කිරීමට අපේක්ෂා කරමි.

භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනයට අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	මේවන විට භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.
සියළුම වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි	මේ වන විට සියළුම වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර ඇත.
බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාරණය වූ ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මූ;රෙ; ප්‍රකාරව මසක් තුල නිරවුල් කර නොතිබුණි.	මේවන විට ගැලපුම් කල යුතුව තිබූ ශේෂ නිරවුල් කර ඇති අතර, ඉදිරියේදී නියමිත කාලය තුල එම කටයුතු නිවැරදිව කටයුතු කරමී.
නිහවරිපනම් අය කර ගැනීම සඳහා වරෙන්තු නිකුත් කිරීමක් කර නොතිබුණි.	මේ වන විට නිහ වරිපනම් සඳහා නීති මාර්ගයෙන් කටයුතු කරමින් පවති.
ටෙන්ඩර් මත වාර්ෂිකව බදු දිය යුතු සභාවේ දේපල සමාලෝචිත වර්ෂය තුලදී එසේ සම්පූර්ණ ලෙස බදුදී නොතිබුණි.	මේවන මුදල් කමිටුව හා මහ සභාවේ අනුමැතියන් වලට යටත්ව එකී කටයුතු සිදු කරමින් පවති.
වාර්ෂික ටෙන්ඩර් මත බදු දුන් දේපල සඳහා ඵළඹිය යුතු ගිවිසුම් සියල්ල පූර්ණ ලෙස ඉටු කර නොතිබුණි.	සියලු බදු දීම් නිසි පරිදි ගිවිසුම් ගතව ඇත.
වාර්ෂික ටෙන්ඩර් මත බදුදීම් සියළු දේපල සඳහා අයවිය යුතු සියළු බදු මුදල් පූර්ණ ලෙස අයකර නොතිබුණි.	මේ සම්බන්ධයෙන් සොයා බලා ඉදිරියේදී එම මුදල්අය කර ගැනීමට කටයුතු කරමි.
2018 ජනවාරි 24 දිනැති අංක/02 /2018 දරණ රා.ප.ව. විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියල කර නොතිබුණි.	මේ වන විට මානව සම්පත් සැලැස්ම සකස් කරමින් පවති.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් 50% කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොවැඩි පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	ඉදිරියේදී එසේ කිරීමට අපේක්ෂා කරමි.
මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුල ජේෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.	මේවන විට ජේෂ්ඨ නිලධාරියෙකු නම් කර ඇත. සංවර්ධන නිලධාරි - එම්.ස්වර්ණා කාන්ති මිය
අනුමත සීමාව ඉක්මවා කාර් මණ්ඩලය බඳවා ගෙන තිබුණි.	බල ප්‍රදේශයේ විශාලත්වය සමඟ දෛනික රාජකාරි කටයුතු සිදු කිරීමේදි ඇති වන ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතියට අනුව අනියම් පදනමේ සේවකයින් යොදවා ගෙන ඇති අතර, පුරප්පාඩු වන කම්කරු තනතුරු සඳහාමෙම අය ස්ථීර කිරීම් කටයුතු කඩින් කඩ සිදු කරමින් පවති.
සැලසුම්ගත පුහුණු අවස්ථාවලදී ලබාදී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% වඩා අඩු මට්ටමක පවති.	ඉදිරියේදි පුහුණුවීම් කටයුතු සඳහා වැඩි අවධානයක් යොමු කිරීමට අපේක්ෂා කරමි.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 492

ආයතනයේ නම - මහියංගනය ප්‍රාදේශීය සභාව

වාර්තාව මගින් හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු වල වත්මන් තත්වය නිවරදි කිරීමට ආයතනය මගින් ගෙන ඇති ක්‍රියාමාර්ග
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ,යටත් ව මට්ටමේ /ව්‍යාවන මට්ටමේ /අභිතකර මට්ටමේ විය	2024,2025 වර්ෂ සඳහා ආයතනයේ ගිණුම් පිළිබඳ මතය තත්වා ගණනනය නොකළ මතය ලෙස ලැබී ඇත.
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවර්ණය වූ අතිරික්ත ,ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	භාණ්ඩ සමීක්ෂණ වලින් අනාවරනය වූ අතිරික්ත, ඌන භාණ්ඩ පිළිබඳව වාර්ශීකව නිර්දේශ ක්‍රියාත්මක කර අදාල වාර්තා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.අතිරික්ත හා ඌණතා හඳුනා ගැනීම සඳහා කමිටුවක් පත් කර ඒ අනුව තීරණයක් ගැනීමට කටයුතු යොදා ඇත.
හිඟ වරිපනම් අයකර ගැනීම සඳහා වරෙන්තු නිකුත් කිරීමක් කර නොතිබුණි.	හිඟ වරිපණම් 60% ක ඉක්මවා අය කර ගෙන ඇත.
වාර්ෂික ටෙන්ඩර් මත බදු දුන් සියලු දේපළ සඳහා අයවිය යුතු සියළු බදු මුදල් පූර්ණ ලෙස අයකර නොතිබුණි.	2024,2025 වර්ෂ සඳහා ටෙන්ඩර් බදු හිඟ බදු මුදල් නොමැත.අයවිය යුතු ටෙන්ඩර් බදු මුදල් අය කර ගැනීම සඳහා නීතිමය කටයුතු කිරීමට කටයුතු යොදා ඇත.
හිඟහිටි බදු කුලී අයකර ගැනීම සම්බන්ධව අදාළ ගිවිසුම් ප්‍රකාරව නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	හිඟ බදු කුලී ඇති බදු කරුවන් සඳහා ගිවිසුම් අවලංගු කිරීම සිදු කර ඇත.
ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මානය කර පවත්වාගෙන ගොස් නොතිබුණි. ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි	දෙපාර්තමේන්තුව සමඟ එක්ව වෙබ් අඩවියක් සකස් කොට ඇත.මහජනයාට පැමිණිලි,ප්‍රශංසා ඉදිරිපත් කිරීමට හැකියාවක් ඇත.
කසළ අපහරනය කිරීම /කසළ කළමනාකරණය කිරීම සඳහා සභාව විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මකකර නොතිබුණි. ප්ලාස්ටික් සහා පොලිතින් ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කිරීමේ සංවිධානාත්මක වැඩපිළිවෙළක් නොතිබුණි.	කසළ කළමනාකරණය නිසි පරිදි සිදු කිරීම සෑම ආයතනයකටම පාහේ දැඩි අභියොගයකි.මෙය කළමනාකරණය කිරීමට අප සභාවද දැඩි වෙහෙසක් ගනිමින් සිටි.මේ සඳහා වසරක් පාසා අයවැය මඟින් ප්‍රතිපාදන වෙන් කර ගැනීම සිදු කරනු ලබයි.දෙපාර්තමේන්තුව මඟින්ද විවිධ ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ලබා දෙයි.නිසි වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු යොදා ඇත.තවමත් ගැටලුකාරී තත්වයක පවති.ප්ලාස්ටික් පොලිතින් වෙනමම එක්රැස් කර බේල් කර විකිණීමට කටයුතු යොදා ඇත.

වරිපනම් කලාපය ඇතුළත ව්‍යාපාරික ස්ථාන වලින් හා ආයතන වලින් රැස් කරණු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අය කර නොතිබුණි.	අයකළ යුතු ගාස්තු ගැසට් කර ඇත.නිසි පරිදි ගාස්තු අය කරනු ලබයි.
2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රෙල්ඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	මානව සම්පත් සැලැස්මක් පිළියෙල කොට ඇත.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	පුහුණු අවස්ථා සඳහා වාර්ෂිකව ප්‍රතිපාදන වෙන් කර පුහුණු අවස්ථාවන් ලබා දෙනු ලැබේ.
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමානය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	85 % වැඩි පුහුණු අවස්ථාවන් ලබා දීමට කටයුතු යොදා ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 492

ආයතනයේ නම - හපුතලේ ප්‍රාදේශීය සභාව

වාර්තාවේ සඳහන් කරුණු	අදාල කාරණය සම්බන්ධයෙන් මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග
විගණන මතය	තත්වාගණනය කල මතය
මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීන නොවීම	මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීන කිරීමට අවශ්‍ය සමීක්ෂණ කටයුතු මේ වන විට ආරම්භ කර ඇති අතර එම සමීක්ෂණ කටයුතු අවසන් වූ පසු එය යාවත්කාලීනව පවත්වා ගෙන යෑමට අවශ්‍ය කටයුතු සිදුකරමි.
අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබීම හා විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදී පිළියෙල කර නොතිබීම	ඉදිරියේදී අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත යැවීමට කටයුතු කරන අතර විගණකාධිපති විමසා අභ්‍යන්තර විගනන වැඩසටහන වර්ෂය ආරම්භයේදීම පිළියෙල කිරීමට අවශ්‍ය කටයුතු කරමි
වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබීම	දැනටමත් රාජය ලාංඡනය සහිත ස්ටිකර් සියලුම වාහන වල අලවා ඇති අතර ඉදිරියේදී පින්තාරු කිරීමට අවහ්‍ය මිල ගණන් කැඳවීමට අවශ්‍ය කටයුතු සිදු කරමි.
බිල් කල ආදායමෙන් අයකිරීම් පහල මට්ටමක පැවතීම හා හිඟ වරිපනම් අයකර ගැනීම සඳහා වරෙන්තු නිකුත් නොකිරීම	2023 වර්ෂයේ හිඟ වරිපනම් බදු රු. 1,265,234.49 ක මුදලක් පැවතියද 2025.12.31 වන විට හිඟ වරිපනම් මුදල රු. 632,742.07 දක්වා අඩු කරගෙන ඇත.ඉතිරි හිඟ මුදලද අය කර ගැනීමට මේ වන විට විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.
පරිසර බලපත්‍ර ලබාගත යුතු සියලු ආයතන පරිසර බලපත්‍ර ලබා නොතිබුණි.	හපුතලේ ප්‍රා දේශීය සභා බල ප්‍රදේශය තුළ පරිසර බලපත්‍ර කටයුතු විධිමත්ව පවත්වාගෙන ගිය අතර මධ්‍යම පරිසර අධිකාරියේ 14/01/1423/2022 හා 2022.02.27 නිකුත් කර ඇති වක්‍රලේඛය මඟින් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගෙන ක්‍රියාත්මක විය යුතු ක්‍රියාකාරකම් ලැයිස්තුව පෙර භාවිතා කල අංක 1553/16 දරණ ගැසට් නිවේදනය අවලංගු කරමින් 2022.01.27 දිනැති අංක 2264/18 දරණ නව ගැසට් නිවේදනය මඟින් ප්‍රාදේශීය සභාවට අයත්ව පැවති පාරිසරික බලපත්‍ර ලබා ගත යුතු කර්මාන්ත සියල්ලම මධ්‍යම පරිසර අධිකාරිය විසින් පවරා ගෙන ඇත.සුළු පරිමාණ කර්මාන්ත පමණක් ප්‍රාදේශීය සභාවට යොමු කර ඇත. ඒ අනුව 2023 වර්ෂයේදී පරිසර බලපත්‍ර 08 නිකුත් කර ඇති අතර 2024 වර්ෂයේදී එම ප්‍රමාණය 12ක් දක්වා වැඩිකර ගෙන බලපත්‍ර නිකුත් කර ඇත.
පුහුණු අවස්ථා ප්‍රමාණය අඩු මට්ටමක පැවතීම	පුහුණු වැඩසටහන් සඳහා2023 වර්ෂයේදී රු. 200,000.00 වෙන් කර ඇති අතර එම මුදල සම්පූර්ණයෙන්ම පුහුණු වැඩසටහන් සඳහා යොදා ගෙන ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 492

ආයතනයේ නම - බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව

වාර්තාවේ හඳුනාගත් අඩුපාඩු	ආයතනය අඩුපාඩු නිවැරදි කිරීමට ගත් ක්‍රියාමාර්ග
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය	තත්වාගතණය කල මතයක් ලැබී ඇත.
මෘදුකාංගයට අදාල මුරපදය තුන් මසකට වරක් වෙනස් කර නොතිබුණි	නිවැරදි කරගැනීමට කටයුතු කර ඇත.
සංයුක්ත සැලැස්මට අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි	වර්තමානයේ මේ අනුව පිළියෙල කර ඇත
සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රසම්පාදන සැලැස්මක් නියමිත දිනට අනුමත කර නොතිබුණි	මේ වන විට නියමිත දිනට ප්‍රසම්පාදන සැලැස්ම අනුමත කරගැනීමට කටයුතු කර ඇත
විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදී පිළියෙල කර නොතිබුණි	වර්තමානයේ විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන පිළියෙල කිරීමට කටයුතු කර ඇත
විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් වාර 4 ක් වත් පවත්වා නොතිබුණි	කාර්තු 4 සඳහාම විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් සඳහා ඉල්ලීම් කර තිබුණද රැස්වීම් වාර 2 ක් පමණක් පවත්වා තිබුණි
බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනට පිළියෙල කර සහතික කර විගණය සඳහා ඉදිරිපත් කර නොතිබුණි	මේ වන විට බැංකු සැසඳුම් නියමිත දිනට පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කරයි
ටෙන්ඩර් මත වාර්ෂිකව බදු දියයුතු සභාවේ දේපළ සමාලෝචිත වර්ෂය තුලදී එසේ සම්පූර්ණ ලෙස බදු දී නොතිබුණි	මේ වන විට අදාල සියළු දේපළ බදු දී ඇත
වාර්ෂික ටෙන්ඩර් මත බදු දුන් දේපල සඳහා ඵලඹිය යුතු ගිවිසුම් සියල්ල පූර්ණ ලෙස ඉටුකර නොතිබුණි	මේ වන විට බදු දුන් දේපළ සියල්ල සඳහා ගිවිසුම් ගතවී ඇත
වාර්ෂික ටෙන්ඩර් මත බදු දුන් සියළු දේපළ සඳහා අයවිය යුතු සියළු බදු මුදල් පූර්ණ ලෙස අයකර නොතිබුණි	මේ වන විට සියළු හිඟ බදු මුදල් අයකරගැනීමට කටයුතු කර ඇත
සභා බල ප්‍රදේශයේ කසල වෙන්කර ලබාගැනීමක් සිදුනොවේ	කසල බැහැර කිරීම සඳහා සුදුසු භූමියක් බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව සතුව නොමැති බැවින් කසල එකතු කිරීමක් සිදු නොකරයි
ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම රැස්කිරීමට වැඩපිලිවෙලක් නොතිබුණි	වර්ෂයකට වරක් ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එක්රැස් කර අදාල ආයතන වලට භාරදෙනු ලැබේ
කසල අපහරණය කිරීම /කසල කළමණාකරනය කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි	මේ වන විට විධිමක් කසල කළමනාකරන වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවතී
වරිපනම් කලාපය ඇතුලත ව්‍යාපාරික ස්ථාන වලින් හා ආයතන වලින් රැස්කරනු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අයකර නොතිබුණි	බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව අපද්‍රව්‍ය එකතු කිරීමක් සිදු නොකරයි.එබැවින් අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අයකිරීමක් සිදු නොකරයි
ප්ලාස්ටික් හා පොලිතීන් ප්‍රතිචක්‍රීයකරණය සඳහා යොමුකිරීමේ සංවිධානාත්මක වැඩපිළිවෙලක් නොතිබුණි	මේ වන විට විධිමක් කසල කළමනාකරන වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවතී
පළාත් පාලන ආයතනයෙන් පරිසර බලපත්‍ර ලබාගත යුතු සියළු ආයතන පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි	මේ වන විට පරිසර බලපත්‍ර ලබාගත යුතු සියළු ආයතන වෙත පරිසර බලපත්‍ර නිකුත් කර ඇත

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 492

ආයතනයේ නම - කතරගම ප්‍රාදේශීය සභාව

පළමු කොටස - 44.00

කමිටුව විසින් හඳුනාගත් දුර්වලතා	දුර්වලතා මහහරවා ගැනීමට ගත් ක්‍රියාමාර්ග
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අභිතකර මට්ටමේ විය.	2024 සහ 2025 වර්ෂවලදී කත්වාගණනය කරන ලද විගණන මතයන් ලබා ගෙන ඇති අතර ඉදිරියේදී හොඳ මතයක් ලබා ගැනීමට කටයුතු කරමි.
ඉඩම් හා ගොඩනැගිලි ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 217 වගන්තිය ප්‍රකාරව පී.එස්.46 ආකෘතිය ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලි ලේඛණය සකස් කර මින් පවතියි.
හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	මෙවන විට හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යනු ලැබේ.
ණයගැති ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මේ වන විට ණයගැති ලේඛණයක් නඩත්තුවේ.
වීථි පහන් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි	2026 වර්ෂයේදී වීථි පහන් පිළිබඳ සංගණනයක් සිදු කර යාවත්කාලීන කිරීමට කටයුතු කරමි.
මිනුම් පොත් යවත්කාලීනව පවත්වා නොතිබීම.	2026 වර්ෂයේ කාර්මික නිලධාරීන් විසින් මිනුම් පොත් නඩත්තු කරමින් පවති.
ඉඩම් කට්ටිකර විකිණීමේ බදු ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබීම.	මේ වන තෙක් මෙවැනි ලේඛනයක අවශ්‍යතාවයක් ඇති වී නැත.
තැන්පත් ලේඛණය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබීම.	මේ වන විට තැන්පත් ලේඛණය යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලැබේ.
ඇස්තමේන්තු ලෙජරය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබීම.	ඇස්තමේන්තු ලෙජරය නඩත්තු කිරීමට කටයුතු කරමි.
ද්‍රව්‍ය ආපසු භාරදීමේ ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබීම.	කාර්යාලය තුළ මෙම ලේඛන නිසි පරිද නඩත්තු වේ.
ගල් හා බොරළු ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබීම.	ඉදිරියේදී මෙම ලේඛණය නඩත්තු කිරීමට කටයුතු කරමි.
මුදල් රෙගුලාසි පරිදි ආයතනය මූල්‍ය බලතල පැවරීමක් සිදු කර නොතිබුණි	මූල්‍ය බලතල පවරා ඇත.
මූල්‍ය බලතල පැවරීම ප්‍රමාණවත් පරිදි ආයතනය තුල සන්නිවේදනය කර නොතිබුණි.	සන්නිවේදනය සිදුකර ඇත.
මෘදුකාංගයට අදාළ මුරපද තුන් මසකට වරක් වෙනස් කර නොතිබීම.	ඉදිරියේදී මුරපද තුන් මසකට වරක් වෙනස් කිරීමට කටයුතු කරමි.
ප්‍රධාන සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	ප්‍රධාන සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කරමි.
සංයුක්ත සැලැස්මට අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර සභා සම්මත කර නොතිබුණි.	සංයුක්ත සැලැස්මට අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කරමි.

සංයුක්ත සැලැස්මට අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	සංයුක්ත සැලැස්මට අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කරමි.
2020.08.28 දිනැති අංක 02/ 2020 දරන රාජ්‍ය මූදල් චක්‍රලේඛයේ 13 ඡේදය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	අදාළ චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කරමි.
සමාලෝචිත වර්ෂයට අදාළව ප්‍රසම්පාදන සැලැස්මක් නියමිත දිනයට අනුමත කර නොතිබීම.	ඉදිරියේදී නියමිත දිනට ප්‍රසම්පාදන සැලැස්ම අනුමත කිරීමට කටයුතු කරමි.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා වීම.	ලැබෙන අභ්‍යන්තර විගණන විමසුම් සඳහා නියමිත දිනට පිළිතුරු සපයනු ලැබේ.
විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදී පිළියෙල කර නොතිබීම.	2024/ 2025 මෙන්ම 2026 වර්ෂයේදීද සඳහා අභ්‍යන්තර විගණන සැලැස්ම අනුමත කර ඇත.
විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් වාර 4ක් වත් පවත්වා නොතිබීම.	2024 සහ 2025 වර්ෂවල විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් පවත්වා ඇත.
සියළු වත්කම්වල ආරක්ෂාව තහවුරු කර නොතිබීම.	මෙවන විට සියළු වත්කම්වල ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු සිදු කර ඇත.
හාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබීම.	මෙවන විට හාණ්ඩ සමීක්ෂණ වාර්තා නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.
වාර්ෂික හාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාලවනවානු තුල ක්‍රියාත්මක කර නොතිබීම.	හාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශ ක්‍රියාත්මක කරමින් පවතී.
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති ඉදිරිපත් කර නොතිබීම.	මෙවන විට දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත නියි පරිදි ඉදිරිපත් කරමි.
වාහනයක් ගර්හිත වීම මාස 8 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබීම.	අපහරණය සඳහා පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂකගේ අනුමැතිය ලබාගැනීමට කටයුතු සිදු කර ඇත.
සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබීම.	දැනට විධිමත් පරිදි ලොග් සටහන් පොත් නඩත්තු කරනු ලැබේ.
සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබීම.	වාහන කිරිපයක් හැර අනෙකුත් සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර ඇති අතර, ඉතිරි වාහනවල ඉදිරියේදී පින්තාරු කිරීමට කටයුතු කරමි.
බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ.ප්‍රකාරව මසක් තුල නිරවුල් කර නොතිබීම.	මෙවන විට අදාළ ගැලපුම් සම්බන්ධව මු.රෙ. ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.
වර්ෂයට අදාළව බිල්කල ආදායමෙන් අයකිරීම් පහල මට්ටමක වීම.	මෙවන විට හිඟ ආදායම්වලින් විශාල මුදලක් අයකර ඇති අතර, ඉතිරිය ඉදිරියේදී අයකිරීමට කටයුතු කරමි.
හිඟ වරිපනම් අයකර ගැනීම සඳහා වරෙන්තු නිකුත් කිරීමක් කර නොතිබීම.	ස්ථිර ආදායම් පරීක්ෂකයෙකු නොමැතිවීම නිසා හිඟ වරිපනම් අයකිරීමට වරෙන්තු නිකුත් කිරීමට නොහැකි වූ අතර ආදායම් පරීක්ෂක නිලධාරියෙකු පැමිණි පසු අය කිරීමට කටයුතු කරමි.
ටෙන්ඩර් මත බදු දුන් සියලු දේපළ සඳහා අයවිය යුතු සියලු බදු මුදල් පූර්ණ ලෙස අයකර නොතිබීම.	මෙම හිඟ මුදල් අයකිරීම සඳහා නිතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත.

දීර්ඝ කාලීනව බදු දුන් දේපළ සියල්ල සඳහා ගිවිසුම් ගත වී කටයුතු අවසන් කර නොතිබීම.	දේපල කිහිපයක් සඳහාම ගිවිසුම් ගතවී ඇති අතර, ගෙවීම් පැහැර කර ඇති බදු හිමියන්ට එරෙහිව තිස්සමහාරාම මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුතු සිදු කර ඇත.
දීර්ඝ කාලීනව බදු දුන් දේපළවලින් වාර්ෂිකව අයකල යුතු බදු කුලි අය කරගෙන නොතිබුණු අවස්ථා විය.	වැඩි ප්‍රමාණයක් අයකර ඇති අතර, ඉතිරිය අයකිරීම සඳහා තිස්සමහාරාම මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුතු සිදු කර ඇත.

දෙවැනි කොටස - 38

කමිටුව විසින් හඳුනාගත් දුර්වලතා	දුර්වලතා මහහරවා ගැනීමට ගත් ක්‍රියාමාර්ග
ආයතනය පිළිබඳව මහජනතාවට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබීම.	මේ වන විට වෙබ් අඩවිය යාවත් කාලීන කර ඇත.
ආයතනය පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රසංශා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබීම.	ඉදිරියේදී පැමිණිලි හෝ ප්‍රසංශා සටහන් කිරීම සඳහා මහජනතාවට අවස්ථාව ලබාදීමට කටයුතු කරමි.
ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන නොතිබීම.	ඉදිරියේදී හඳුනාගැනීමට කටයුතු කරමි.
හඳුනාගත් තිරසර අරමුණු ඉටුකර ගැනීම සඳහා ළඟාකර ගත යුතු ඉලක්ක තීරණය කර නොතිබීම.	ඉදිරියේදී ඉලක්ක තීරණය කිරීමට කටයුතු කරමි.
හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැනි බැලීම සඳහා ජයග්‍රහණ දර්ශක නියම කර නොතිබීම.	ඉදිරියේදී ජයග්‍රහණ දර්ශක නියම කිරීමට කටයුතු කරමි.
පළාත් පාලන ආයතනයේ පරිසර බලපත්‍ර ලබා ගත යුතු සියළු ආයතන පරිසර බලපත්‍ර ලබා ගෙන නොතිබීම.	මේ වන විට විගණනයෙන් පෙන්වා දුන් පරිදි සියළු පරිසර ලබා ගත යුතු කර්මාන්ත සඳහා පරිසර බලපත්‍ර ලබා දීමට කටයුතු කර ඇත.
මහනගර සභා ආඥා පනතේ 272 වගන්තිය/නගර සභා ආඥා පනතේ 157 වගන්තිය/ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව අතුරු ව්‍යවස්ථා පනවා නැත.	ඉදිරියේදි විෂයයන් කිහිපයකට අදාළව අතුරු ව්‍යවස්ථා පැනවීමට නියමිතය.
අතුරු ව්‍යස්ථා අනුව සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යන් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කර නොතිබීම.	ඉදිරියේදි අදාළ පරිදි වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කරමි.
ආයතනයේ පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට හාජනය කිරීමට ක්‍රමවේදයක් සකස්කර නොතිබීම.	ඉදිරියේදි සුදුසු ක්‍රමවේදයක් සකස් කරමි.

2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබීම.	මේ වන විට මානව සම්පත් සැලැස්ම සකස් කර ඇත.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	සැලැස්ම හරහා සෑම සේවකයෙකුටම පුහුණු අවස්ථාවක් ලබාදීමට කටයුතු කරමි.
සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබීම.	මේවන විට කාර්ය සාධන ගිවිසුම් සකස්කර ගිවිසුම් ගතව ඇත.
මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරයෙකු නම් කර නොතිබීම.	මේ වන විට ප්‍රාදේශීය සභාව සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරයෙකු නම් කර ඇත.
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබාදී තිබුණු පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතීම.	ඉදිරියේදී වැඩි පුහුණු අවස්ථා සේවකයින් ලබාදීමට කටයුතු කරමි.
2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිනුම් කළ හැකි කාර්යසාධක දර්ශක 03ක් හඳුනාගෙන නොතිබීම.	ඉදිරියේදී අදාළ කාර්යසාධක දර්ශක හඳුනා ගැනීමට කටයුතු කරමි.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 492

ආයතනයේ නම - බුත්තල ප්‍රාදේශීය සභාව

පළමු කොටස - 44

	කමිටුව විසින් හඳුනාගත් දුර්වලතා	දුර්වලතා මග හරවා ගැනීමට ගත් ක්‍රියා මාර්ග
01	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ,යටත්ව මට්ටමේ/ව්‍යාවනය මට්ටමේ/අහිතකර මට්ටමේ විය.	2023.12.31 දිනෙන් අවසන් වර්ෂයේ තත්ත්වාගනනය කළ මතයක් ලැබී ඇත.
02	ඉඩම් හා ගොඩනැගිලි ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	යාවත් කාලීන කර ඇත.
03	ස්ථාවර වත්කම් ලේඛනය යාවත් කාලීනව පවත්වා නොතිබුණි.	යාවත්කාලීන කර ඇත.
04	කොන්ත්‍රාත් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	යාවත්කාලීන කරමින් පවතී.
05	ලැබෙන වෙක්පත් මුදල් ඇනවුම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	යාවත්කාලීන කර ඇත.
06	බඩු වට්ටෝරු ලේඛනය /පාරිභෝගික ද්‍රව්‍ය ලේකණය යාවත්කාලීනව පවත්වා නැත.	යාවත්කාලීන කර ඇත.
07	වීපී පහන් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි	යාවත්කාලීන කරමින් පවතී.
08	මිණුම්පොත් යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	සකස් කිරීමට උපදෙස් ලබාදී ඇත.
09	ඉඩම් කට්ටි කර විකිණීමේ බදු ලේඛනය යාවත්කාලීනව පවත්වා නොමැත.	නැත.
10	ගොඩනැගිලි අයදුම්පත් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	යාවත්කාලීන කර ඇත.
11	අනුකූලතා සහතික ලබාදීම ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	යාවත්කාලීන කර ඇත.
12	ඇස්මේන්තු ලෙජරය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	යාවත්කාලීන කිරීමට උපදෙස් ලබා දී ඇත.
13	ද්‍රව්‍ය ආපසු භාරදීමේ ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	යාවත්කාලීන කර ඇත.
14	ගල් හා බොරලු ලේඛනය නිසිපරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	යාවත්කාලීන කිරීමට උපදෙස් ලබාදී ඇත.
15	සභාව විසින් වියදම් සීමාවන් තීරණය නගරාධිපතිවරයා/සභාපතිවරයා සහ නිලධාරීන් වෙත පැවරීමක් සිදුකර නොතිබුනි.	බලතල පවරා ඇත.
16	මුදල් රෙගුලාසි පරිදි ආයතනය තුළ මූල්‍ය බලතල පැවරීමක් සිදුකර නොතිබුණි.	මූල්‍ය බලතල පවරා ඇත.
17	මූල්‍යබලතල ප්‍රමාණවත් පරිදි ආයතනය තුළ ඝන්නිවේදනය කර නොතිබුණි.	මූල්‍යබලතල පැවරීම පිළිබඳව ආයතනය තුල ඝන්නිවේදනය කර ඇත.
18	මූල්‍ය බලතල පැවරීමේදි සෑම ගණුදෙණුවක්ම ප්‍රමාණවත් තරම් පරීක්ෂාවට ලක්වන පරිදි බලතල පවරා නොතිබුණි.	බලතල පවරා ඇත.
19	ප්‍රධාන සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	සංයුක්ත සැලැස්ම සකස් කිරීමට උපදෙස් ලබා දී ඇත.
20	සංයුක්ත සැලැස්මට අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර සභා සම්මත කර නොතිබුණි.	ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කරයි.
22	සංයුක්ත සැලැස්මට අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර	ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර ඇත.

	නොතිබුණි.	
23	202.008.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 13 ඡේදයේ ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කරයි.
24	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම පිළිතුරු සපයා නොතිබුණි	පිළිතුරු සපයා ඇත.
25	විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන් වර්ෂය ආරම්භයේදී පිළියෙල කර නොතිබුණි.	විගණන වැඩසටහන් සකස් කරයි.
26	විගණන හා කළමණාකරන කමිටු රැස්වීම්වාර 04ක් පවත්වා නොතිබුණි.	අභ්‍යන්තර විගණන කමිටුව මගින් රැස්වීම් පැවැත්වීම සිදුකර නොමැත.
27	සියලුම වත්කම්වල ආරක්ෂාව තහවුරු කර නොතිබුණි.	වත්කම්වල ආරක්ෂාව තහවුරු කිරීමට අවශ්‍ය කටයුතු කරමින් ඇත.
28	භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	නියමිත දිනට ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.
29	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරනය වූ අතිරික්ත හා ඌනතා වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාලවකවානුව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	නියමිත දිනට ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.
30	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් මාසික සාරාංශ වාර්තා විගනකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	දෛනික ධාවන සටහන් විගනකාධිපති වෙත යොමු කර ඇත.
31	වාහනයක් ගර්හිත වී මාස 08 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	ගර්හිත වාහන නැත.
32	සෑම වාහනයක් සඳහාම ලොග්පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි.	ලොග්පොත් යාවත්කාලීන කරයි.
33	සියලු වාහනවල රාජ්‍ය ලාංඡන පිංතාරු කර නොතිබුණි.	පින්තාරු කිරීමට අවශ්‍ය කටයුතු කර ඇත.
34	බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනට පිළියෙල කර සහතික කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.	බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනට විගණනයට ඉදිරිපත් කර ඇත.
35	ජංගම ගිණුමේ අතිරික්ත මුදල් කාලීන තැම්පතුවල සුදුසු පරිදි ආයෝජනය කිරීම සඳහා වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි.	ජංගම ගිණුමේ අතිරික්ත මුදල් නැත.
36	මුදල් වර්ෂයට අදාල බිල්කළ ආදායමෙන් අය කිරීම් පහල මට්ටමේ විය.	ආදායම් අය කිරීමට කටයුතු කර ඇත.
37	දීර්ඝ කාලීනව බදු දුන් දේපල වලින් වාර්ෂිකව අය කළ යුතු බදු කුලී අයකරගෙන නොතිබුණි.	ආදායම් අයකර ගැනීමට කටයුතු සම්පාදනය කර ඇත.
38	ව්‍යාපාර බලපත්‍ර ලබා නොදුන් ආයතන සඳහා නඩු පැවරීමක් සිදුකර නොතිබුණි.	ව්‍යාපාර බලපත්‍ර ආයතන විසින් ලබා ගෙන ඇත.

දෙවැනි කොටස-38.50

	කමිටුව හඳුනාගත් දුර්වලතා	දුර්වලතා මගහරවා ගැනීමට ගත් ක්‍රියාමාර්ග.
01	සභාවට අදාල ප්‍රගාමී තොරතුරු ප්‍රදර්ශනය කර නොතිබුණි.	තොරතුරු ප්‍රදර්ශනය කර ඇත.
02	ආයතනය තම විෂය පථය අනුව තිරසාර අරමුණු හඳුනාගෙන නොතිබුණි.	තිරසාර අරමුණු හඳුනා ගැනීමට කටයුතු කර ඇත.
03	හඳුනාගත් තිරසර අරමුණු ඉටුකර ගැනීම ලඟා කර ගතයුතු ඉලක්ක තීරණය කර නොතිබුණි .	තිරසාර අරමුණු ඉටුකර ලඟාකර ගතයුතු ඉලක්ක හඳුනාගෙන ඇත.
04	හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා ජයග්‍රහන දර්ශක නියමකර නොතිබුණි.	නාගරික සංවර්ධන අධිකාරිය සමග එක්ව පස් අවුරුදු සැලැසුමක් සකස් කර ඇත.
05	ඉලෙක්ට්‍රෝණික් අපද්‍රව්‍ය රැස් කිරීමට වැඩපිළිවෙලක් නොතිබුණි.	එකතු වී ඇති අපද්‍රව්‍ය වෙන්දේසි කිරීමට සැලසුම් කර ඇත.
06	වරිපනම් කළාපය ඇතුළත ව්‍යාපාරික ස්ථානවලින් හා ආයතනවලින් රැස්කරනු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අය කර නොතිබුණි.	කසලබදු අය කලයුතු ස්ථාන පිළිබඳව තොරතුරු රැස් කරයි.
07	පළාත් පාලන ආයතනයෙන් පරිසරබලපත්‍ර ලබාදිය යුතු සියලු ආයතන පරිසර බලපත්‍ර ලබා ගෙන නොතිබුණි	ප්‍රාදේශීය සභා මට්ටමේ ලබාදියයුතු බලපත්‍ර ලබාදී ඇත.
08	මහ නගර සභා ආඥා පනතේ 272 වගන්තිය /නගර සභා ආඥා පනතේ 157 වගන්තිය/ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.	අතුරු ව්‍යවස්ථා වැලදගෙන ඇත.
09	අතුරු ව්‍යවස්ථා පරිශීලනය කිරීම සඳහා මහජනතාවට ප්‍රවේශයක් සලසාදී නොතිබුණි.	මහජනතාවට අවස්ථාව සලසා දී ඇත.
10	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර ඇත.
11	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට අවම වශයෙන් පැය 12 අඩු පුහුණු අවස්තාවක් සහතික කර නොතිබුණි.	පුහුණු අවස්ථා සලසාදී ඇත.
12	මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුනතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධරයකු නම්කර නොතිබුණි.	නම් කර ඇත.
13	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවාගෙන තිබුණි.	වාර්ෂික ස්ථානමාරු මත අනුමත කාර්ය මණ්ඩල සීමාව ඉක්මවා ඇත.
14	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	පුහුණු අවස්ථාවන් ලබා දී ඇත.
15	2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 12.1ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටුකළයුතු කාර්යභාරය පැහැදිලිවන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළහැකි කාර්යසාධන දර්ශක 03 ක් හඳුනාගෙන නොතිබුණි.	-
16	නිලධාරීන්ගෙන් රජයට පළාත් සභාවට හෝ සභාවට සිදුවූ පාඩු පූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	නිලධාරීන්ගේ සිදුවූ හානි පිළිබඳව වාර්තාවී නැත.
17	අය කළයුතු අධිභාර අයකර නොතිබුණි.	ලිපි මාර්ගයෙන් දැනුවත් කිරීම් සිදු කරයි.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 492

ආයතනයේ නම - තණමල්විල ප්‍රාදේශීය සභාව

කමිටුව විසින් හඳුනාගත් ගැටළුව	අඩුපාඩු වත්මන් තත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියා මාර්ග
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය,යටත්ව මට්ටමේ.ව්‍යාවන මට්ටමේ,අභිතකර මට්ටමේ විය.	විගණනය පෙන්වා දුන් අඩුපාඩු හා දුර්වලතා මහඟරවා ගනිමින් කටයුතු කරන අතර 2023 වර්ෂයේ තත්වාගතණය කල මතයක් දක්වා වර්ධනය කර ඇත.
වීථි පහන් ලේඛනයක් යාවත්කාලිනව පවත්වා නොතිබුණි	වීථි පහන් ලේඛනයක් යාවත්කාලිනව පවත්වාගෙන යනු ලැබේ.
මිනුම්පොත යාවත්කාලිනව පවත්වා නොතිබුණි.	මේ වන විට මිණුම් පොත යාවත්කාලිනව පවත්වාගෙන යනු ලැබේ.
මාර්ග ඉන්වෙන්ට්‍රියක් යාවත්කාලිනව පවත්වා නොතිබුණි.	සභාවට අයත් මාර්ග ගැසට් කිරීමේ කටයුතු සිදු කිරීමට පියවර ගනිමින් සිටින අතර, මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීන කරමින් පවත්වාගෙන යනු ලැබේ
නඩු ලේඛනයක් නිසි පරිදි යාවත්කාලිනව පවත්වාගෙන නොතිබුණි.	මේ වන විට නඩු ලේඛනයක් ලේඛණය යාවත්කාලිනව පවත්වාගෙන යනු ලැබේ.
අස්තමේන්තු ලෙජරය නිසි පරිදි යාවත්කාලිනව පවත්වාගෙන නොතිබුණි.	ඇස්තමේන්තු ලෙජරයක් නිසි පරිදි යාවත්කාලිනව පවත්වාගෙන යනු නොලැබේ
දුව්‍ය ආපසු හාරදීමේ ලේඛනයක් නිසි පරිදි යාවත්කාලිනව පවත්වාගෙන නොතිබුණි.	දුව්‍ය ආපසු හාරදීමේ ලේඛනයක් නිසි පරිදි යාවත්කාලිනව පවත්වාගෙන යනු ලැබේ.
ගල් පොරළු ලේඛනයක් නිසි පරිදි යාවත්කාලිනව පවත්වාගෙන නොතිබුණි.	මේ වන විට ගල් බොරළු ලේඛනයක් පවත්වාගෙන යනු ලැබේ.
මුදල් රොගුලාසි පරිදි ආයතනය තුල මූල්‍ය බලතල පැවරීමක් සිදු කර නොතිබුණි.	මූල්‍ය බලතල පැවරීම සිද කර ඇත.
මූල්‍ය බලතල පැවරීම ප්‍රමානවත් පරිදි ආයතනය තුල සන්නිවේදනය කර නොතිබුණි.	මූල්‍ය බලතල පැවරීමක් සිදු කර ආයතනය තුල සන්නිවෙදනය සිදු කර ඇත.
මාසික වැටුප් ලේඛන හා පාලන ගිණුම් තුලනය කර සහ අදාල සැසදුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි.	මේ වන විට මාසික වැටුප් ලේඛන හා පාලන ගිණුම් තුලනය කර අදාල සැසදුම් ප්‍රකාශ පිළියෙල කිරීම නිසියාකාරව පිලියෙල කරනු ලැබේ.
මෘදුකාංගයට අදාල මුර පද තුන්මසකට වරක් වෙනස් කර නොතිබුණි.	මේ වන විට මුර පදය වෙනස් කරීම සිදු කරනු ලබයි
ප්‍රධාන සංයුත සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	මේ වන විට ප්‍රධාන සංයුත සැලැස්ම පිළියෙල කර ඇත.
සංයුත සැලැස්මට අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	සංයුත සැලැස්මට අනුව ප්‍රසම්පාදන සැලසැස්ම සකස කර ඇත.
සංයුත සැලැස්මට අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	මේ වන විට නියමිත දිනට ප්‍රසම්පාදන සැලැස්ම සකස්කර කළමණාකරන කමිටුව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ඇත.
2020.08.28 දිනැති අංක 02/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ 13 ඡේදය ප්‍රකාරව වාර්ෂිකව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත
මු.රෙ ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත්	අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත.

විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	
මු.රෙ ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත.
විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන් වර්ෂය ආරම්භයේදී පිළියෙල කර නොතිබුණි.	විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදී පිළියෙල කිරීමට කටයුතු යොදා ඇත.
විගණන හා කළමණාකරණ කමිටුවේ රැස්වීම් අවම වශයෙන් දෙකක් හෝ පවත්වා නොතිබුණි.	විගණන හා කළමණාකරණ කමිටුවේ රැස්වීම් පැවැත්වීමට පියවර යොදා ඇත.
සියලු වත්කම් වල ආරක්ෂාව තහවුරු කර නොතිබුණි.	සභාව සතු සියලුම වත්කම් ආරක්ෂා කිරීමට කටයුතු සිදු කර ඇත.
වර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානුව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	වර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා භාන්ඩ පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානුව තුළ ක්‍රියාත්මක කරනු ලබයි.
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	මේ වන විට දෛනික ධාවන සටහන් හා මාසික වාර්තා සකස්කර ඉදිරිපත් කරනු ලබයි.
වාහනයක් ගර්හිත වී මාස 8 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	ආයතනය සතුව ධාවනයෙන් ඉවත් කර ඇති වාහන වලින් වඩාත් ඵලදායිවන වන වාහන නැවත අලුත්වැඩියාකර භාවිතයට ගැනීම සිදු කල හැකි අතර, සභා අරමුදලේ පවතින ප්‍රතිපාදන මත එම වාහන අලුත්වැඩියාකර නැවත භාවිතයට ගැනීම සිදු කරන බැවින් වාහන අපහරනය කිරීම සිදු නොකරන ලදී.
සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි.	ධාවනය වන සෑම වාහනයක් සඳහාම ලොග් සටහන් පොත් යාවතකාලීනව පවත්වාගෙන යන් ලැබේ.
සියලුම වාහන සඳහා රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි	මේ වන විට සියලුම වාහන සඳහා රාජ්‍ය ලාංඡනය පින්තාරු කර ඇත.
හිඟ හිටි බදු කුලී අයකර ගැනීම සම්බන්ධව අදාල ගිවිසුම් ප්‍රකාරව නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	මේ වන විට හිඟ බදු කුලී අයකරගනිමින් පවති.
දිර්ඝ කාලීනව බදු දුන් දේපළ සියල්ල සඳහා ගිවිසුම් ගත වී කටයුතු අවසන් කර නොතිබුණි.	මේ වන විට සියලුම දේපල සම්බන්ධව ගිවිසුම් ගත වීමේ කටයුතු සිදු කරමින් පවති.
දිර්ඝ කාලීනව බදු දුන් දේපළ වලින් වාර්ෂිකව අයකළ යුතු බදු කුලී අය කරගෙන නොතිබුණු අවස්ථා විය.	මේ වන විට අයකර ගනිමින් පවති

දෙවැනි කොටස : 33.50

තොරතුරු නිළධාරියා /නිළධාරීන් සහ නම් කල නිලධාරියා (අභියාචනා නිලධාරියා) පිලිබඳ දත්ත මහජනයාට ප්‍රදර්ශනය කර නොතිබුණි.	මේ වන විට ප්‍රදර්ශනය කර ඇත.
ආයතන පිළිබඳ මහජනයාට අවශ්‍ය තොරතුරු ලබා දීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	මෙම සභාව සඳහා වෙබ් අඩෙවියක් නිර්මාණය කිරිම මේ වන විට ඌව පළාත්පාලන දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම මත ආරම්භ කිරිමට අදාල කටයුතු සිදු කරගෙන යනු ලැබේ.
ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රසංසා සටහන් කිරිම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	වෙබ් අඩවිය නිර්මාණය කිරිමෙන් පසුව වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රසංසා සටහන් කිරිම සඳහා අවස්ථාව ලබා දෙන බව කාරුණිකව දන්වා සිටිමි.
ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුනු හදුනාගෙන නොතිබුණි.	ඉදිරියේදි තිරිසර අරමුනු හදුනාගෙන කටයුතු සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි
හදුනාගත් තිරසර අරමුනු ඉටුකර ගැනිම සඳහා ළඟා කර ගත යුතු ඉලක්ක තීරණය කර නොතිබුණි	එම අරමුණු හදුනාගෙන ඉලක්ක ලගා කර ගැනිම සඳහා කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි
හදුනාගත් ගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරිමේ ප්‍රගතිය මැන බැලීම සඳහා ජයග්‍රහන දර්ශක නියම කර නොතිබුණි.	හදුනාගත් ගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරිමේ ප්‍රගතිය මැන බැලීම සඳහා ජයග්‍රහන දර්ශක මේ වන විට ක්‍රියාත්මක කරමින් ඇත.
ජාතික ප්‍රතිපත්තිවලට අනුකූලව කසල කළමණාකරන සැලැස්මක් සකස් කර නොතිබුණි	මේ වන විට කසල කළමණාකරන සැලැස්මක් සකස් කරමින් පවතී
වරිපනම් කලාපය ඇතුළත ව්‍යාපාරික ස්ථාන වලින් හා ආයතන වලින් රැස්කරනු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අය කර නොතිබුණි	මේ වන විට වරිපනම් ප්‍රදේශ හදුනාගැනීමකෙටයුතු අවසන් කර ඇති නමුත් තවමත් වරිපනම් අය කිරිමේ කටයුතු ආරම්භ කර නොමැති අතර මේ වන විට ව්‍යාපාරික ස්ථානවලින් හා අයායතන වලින් කසල ලබා ගැනිම වෙනුවෙන් ගාස්තු අය කරනු ලැබේ.
ප්ලාස්ටික් සහ පොළිතින් ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කිරිමේ සංවිධානාත්මක වැඩපිළිවෙලක් නොතිබුණි.	මේ වන විට ප්ලාස්ටික් සහ පොළිතින් ප්‍රතිචක්‍රීකරණය සඳහා වැඩ පිළිවෙලක් සකස් කරමින් පවති.
මහ නගර සභා අඥා පනතේ 272 වගන්තිය/නගර සභා ආඥා පනතේ 157 වගන්තිය/ ප්‍රා දේශිය සභා පනතේ 126 වගන්තිය අනුව අතුරු ව්‍යවද්ථා පනවා නොතිබුණි.	අතුරු ව්‍යවස්ථා පනවාගෙන ඇත
අතුරු ව්‍යස්ථා අනුව සභාව විසින් ඉටුකලයුතුව තිබුණු කර්තව්‍යයන් වර්ෂික ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කර නොතිබුණි.	මේ වන විට වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සභසමින් පවතින අතර අතුරු ව්‍යස්ථා අනුව සභාව විසින් ඉටුකලයුතුව තිබුණු කර්තව්‍යයන් සැලැස්මක ඇතුලත් කිරිමට අවශ්‍ය පියවර ගෙන ඇත.
අතුරු ව්‍යවස්ථා පරිශිලනය කිරිම සඳහා මහජනතාවට ප්‍රවේශයක් සලසා දී නොතිබුණි	ප්‍රධාන කාර්යාලය,උප කාර්යාලය මහජන පුස්තකාලය වෙතින් මහජනතාවට අතුරු ව්‍යවස්ථා පරිශිලනය කිරිමට අවස්ථාව සලසා ඇත.
ආයතනයේ පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	ආයතනයේ පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් වධිමත් ක්‍රමවේදයක් සකස් කර ඇත.

2018.ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන වක්‍රෙල්ඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	මේ වන විට විධිමත් මානව සම්පත් සැලසැස්මත් සකස් කර ඇත.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	මෙම වසරේ සිට කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථා ලබා දීමට කටයුතු කිරීමට පියවර යොදා ඇත.
මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමටද ධාරිතා සහ නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුල ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම්කර නොතිබුණි.	මේ වන විට පත්කර ඇත.
අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බදවාගෙන තිබුණි.	අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා මුරකරුවෙකු හා සෞඛ්‍ය කම්කරුවෙකු සිටිඅතර මේ වන විට එම තනතුරු අතිරික්ත නොවන බව දන්වා සිටිමි
සැලසුම් ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% වඩා අඩු මට්ටමක පැවතුණි.	මේ වසරේ සිට පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ඉක්මවා ලබා දීමට පියවර යොදා ඇත.
2020.08.28දිනැති අංක 02/2020 දරණ රාජ්‍ය මූදල් වක්‍ර ලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි වන පරිදි එහි ප්‍රගතිය මිනුම් කල හැකි කාර්යසාධන දර්ශක 03 ක් හදුනාගෙන නොතිබුණි.	ඉදිරියේදී මෙම 2020.08.28දිනැති අංක 02/2020 දරණ රාජ්‍ය මූදල් වක්‍ර ලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි වන පරිදි එහි ප්‍රගතිය මිනුම් කල හැකි කාර්යසාධන හදුනාගෙන කටයුතු සිදු කිරීමට කටයුතු කරන පව කාරුණිකව දන්වා සිටිමි.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 492

ආයතනයේ නම - වැල්ලවාය ප්‍රාදේශීය සභාව

කාරණය	ගෙන ඇති ක්‍රියා මාර්ගය
01. ආයතනයේ ගිණුම පිළිබඳ විගනන මතය	යටත්ව මවිටම
02. මිනුම් පොත් යාවත්කාලීනව පවත්වාගෙන නොතිබුණි	2025 වර්ෂයේ සිට අදාල මිනුම් පොත් පවත්වාගෙන යනු ලැබේ.
03. මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීනව පවත්වාගෙන නොතිබුණි	මේ වන විට බල ප්‍රදේශය තුළ පවතින මාර්ගයන් හී තොරතුරු රැස්කරමින් පවතින අතර, සියලු තොරතුරු ලබා ගැනීමෙන් අනතුරුව මාර්ග සංවර්ධනය අනුව මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීන කිරීම සිදුකරනු ලැබේ.
04. ඇස්තමේන්තු ලෙජරය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි	2025 වර්ෂයේ සිට යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇත.
05. ගල් හා බොරළු ලේඛණය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි	2026 වර්ෂයේ සිට ලේඛණ ගත වාර්තා පවත්වාගෙන යනු ලැබේ.
07. මුදල් රෙගුලාසි පරිදි ආයතනය තුළ මූල්‍ය බලතල පැවරීමක් සිදුකර නොතිබුණි	මේ වන විට විධිමත් පරිදි බලතල පැවරීම් කටයුතු සිදුකර ඇත
08. මූල්‍ය බලතල පැවරීම ප්‍රමාණවත් පරිදි ආයතනය තුළ සන්නිවේදනය කර නොතිබුණි	කාර්යමණ්ඩලයේ සියළු දෙනාටම දැනගැනීමට හැකිවන පරිදි දැනුවත් කිරීම් සිදුකර ඇත
09. මෘදුකාංගයට අදාල මුරපද තුන්මසකට වරක් වෙනස් කර නොතිබුණි	මෘදුකාංගයේ මුරපදය වෙනස්කිරීමේ හැකියාවක් නොමැති අතර, පරිගණක යන්ත්‍රයේ මුරපදය තුන් මසකට වරක් වෙනස් කිරීම සිදුකරනු ලැබේ
10. ප්‍රධාන සංයුක්ත සැලැස්ම අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කොට සභා සම්මත කර නොතිබුණි	2025 වර්ෂයේ සිට අදාල සැලැස්ම සකස් කර සම්මත කර ගන්නා ලදී.
11. සංයුක්ත සැලැස්මට අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙළ කර නොතිබුණි	සංයුක්ත සැලැස්මට අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම 2024 වර්ෂයේ සිට සකස් කර ඇත
12. 2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 13 ඡේදය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කර පිළියෙළ කර නොතිබුණි	2025 වර්ෂයේ සිට අදාල සැලැස්ම සකස් කර ක්‍රියාත්මක කරනු ලැබේ.
13. සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රසම්පාදන සැලැස්මක් නියමිත දිනට අනුමත කර ගෙන නොතිබුණි .	මේ වන විට ප්‍රසම්පාදන සැලැස්ම නියමිත කාලය තුළ සකස් කර අනුමත කර ගෙන ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.
14. මූ.රෙ. ප්‍රකාරව අභ්‍යන්තර විගනන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි	2026 වර්ෂයේ සිට අභ්‍යන්තර විගණයන් සිදුකර අදාල වර්තා විගණකාපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ
15. විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේ දී පිළියෙළ කර නොතිබුණි	විගනාකාධිපති ගේ උපදෙස් පරිදි මෙම වර්ෂයේ සිට අභ්‍යන්තර විගණන වැඩසටහන සකස් කිරීමට කටයුතු කරනු ලැබේ.
16. විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් වාර 4 ක් වත් පවත්වා නොතිබුණි	2026 වර්ෂයේ සිට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.

17. සියළු වත්කම්වල ආරක්ෂාව තහවුරු කර නොතිබුණි	ඉඩම් හා පොදු සුසානභූමි මැනුම් කටයුතු සඳහා ඉදිරිපත් කර ඇති අතර, අනෙකුත් වත්කම්වල ආරක්ෂාව තහවුරු කර ඇත.
18. භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි	2025 වර්ෂයේ සිට ඉදිරියට සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණවලට අදාල වාර්තා විගණකාධිපති වෙත යොමු කිරීමට කටයුතු කර ඇත.
19. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත , ඌණතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි	2024 .12.31 දිනට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ මගින් 2023 වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිතව පැවති නිර්දේශ ක්‍රියාත්මක කරන ලදි. ඉන් ඉදිරියට වාර්ෂිකව භාණ්ඩ සමීක්ෂණයෙන් ලබාදෙන නිර්දේශ නියමිත පරිදි ක්‍රියාත්මක කරනු ලැබේ.
20. සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි	සංචිත වාහනවල දෛනික ධාවන සටහන් හා මාසික වාර්තා 2025 වර්ෂයේ සිට විගණකාධිපති වෙත යවා ඇත.
21. වාහනයක් ගර්හිත වී මාස 08 වඩා අඩු කාලයක දී අපහරණය කර නොතිබුණි.	ගර්හිත තත්වයේ වාහන 03 ක් අපහරණය සඳහා කටයුතු කරමින් පවති.
22. සෑම වාහනයක් සඳහාම ලොග්පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි	සෑම වාහනයක් සඳහාම ලොග් සටහන් පොත් යාවත් කාලීනව පවත්වාගෙන යනු ලැබේ.
23. සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි	මේ වන විට සියලුම වාහන සඳහා අවශ්‍ය රාජ්‍ය ලාංඡන පින්තාරු කර ඇති අතර, කඩිනමින් වාහන වල ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරනු ලැබේ.
24. ජංගම ගිණුමේ අතිරික්ත මුදල් කාලීන තැන්පතුවල සුදුසු පරිදි ආයෝජනය කිරීම සඳහා වැඩ පිළිවෙළක් සකස්කර නොතිබුණි	2023 වර්ෂයේ ජංගම ගිණුමේ අතිරික්තයක් පෙන්නුම් කළද එම මුදල ප්‍රාග්ධන වියදම් පියවීම සඳහා භාවිතා කරනු ලබන හෙයින් , ආයෝජනය කිරීමට තරම් ප්‍රමාණවත් මුදලක් ඉතිරි නොවුණි
25. වර්ෂයට අදාල බිල් කළ ආදායමෙන් අය කිරීම පහල මට්ටමක විය	2025 වර්ෂයේ සිට ආදායම් රැස්කිරීම වර්ධනය කර ගැනීම සඳහා ජංගම සේවා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම , පුරප්පාඩුව පැවති ආදායම් පරීක්ෂක නිළධාරීන් සම්පූර්ණ කර ගැනීම තුළින් ක්ෂේත්‍ර රාජකාරි කටයුතු කාර්යක්ෂම කිරීම තුළින් ආදායම් රැස්කිරීම වර්ධනය කර ගැනීමට කටයුතු කරන ලදි.
26. භිග වරිපනම් අයකර ගැනීම සඳහා වරෙන්තු නිකුත් කිරීමක් කර නොතිබුණි	වරෙන්තු නිකුත් කිරීමට පෙර අදාල භිගයන් ගෙවීම් කරන ලෙස පළමු අදියර වශයෙන් ලිපි තුනක් මගින් දැනුවත් කර ඇත . මේවන විට වරෙන්තු කටයුතු සඳහා සභා අනුමැතිය ලබාගෙන ඇත.
27. වාර්ෂික ටෙන්ඩර් මත බදු දුන් සියලු දේපළ සඳහා අයවිය යුතු සියළු බදු මුදල් පූර්ණ ලෙස අයකර නොතිබුණි	මාසික බදු කුළි ගෙවීමේදී අදාල මාසය පසු වී දින 10 ක කාලයක් ගෙවීම් කටයුතු සඳහා ලබාදෙන හෙයින් 2023 වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාල ගාස්තු 2024 ජනවාරි මස අය වී ඇති අතර, දීර්ග කාලීනව පවතින භිගයන් සඳහා ගෙවීම් කරන ලෙස ලිපි මගින් අදාල බදුකරුවන් දැනුවත් කර ඇත.
28. භිග හිටි බදු කුළි අයකර ගැනීම සම්බන්ධව අදාල ගිවිසුම් ප්‍රකාරව නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි	දීර්ඝ කාලීනව පවතින භිගයන් අයකර ගැනීම සඳහා නීතිමය කටයුතු කිරීමට පෙර අවසන් නීවේදන නිකුත් කර ඇති අතර, ඇප තැන්පතු වලින් හිලව්කර ගැනීම හැකියාව පවතින භිගයන් පියවා ගැනීමට කටයුතු කර ඇත. එසේම කොරෝනා වසංගත තත්වය හේතුවෙන් කපා හැරීම් සඳහා යොමු කරන ලද භිගයන් තීරණයක් ලැබෙන තුරු ලේඛණගතව භිගයන් ලෙස පවත්වාගෙන යනු ලැබේ.
29. දීර්ඝ කාලීනව බදු දුන් දේපළවලින් වාර්ෂිකව අය කල යුතු බදු කුළි අයකරගෙන නොතිබුණු අවස්ථා විය	මේ වන විට දීර්ඝ කාලීනව බදු දී ඇති දේපළ වලින් ගෙවීම් කටයුතු නොකරන දේපළ සහා හාරයට ගෙන අදාල බදුකරුවන් සඳහා නීතිමය කටයුතු ආරම්භ කර ඇත
